ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
නීතිවේදී උපාධි පාඨමාලාව - 3 වන මට්ටම
අවසාන පරීක්ෂණය - 2006
නීති ක්‍රම - **LWU 1412**
කාලය - පැය තුනයි.

දිනය - 2006.04.04 වේලාව - ප.ව.01.30 -ප.ව.04.30 දක්වා

*අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.*

*යටත් පිරිසෙයින් එක් කොටසකින් ප්‍රශ්න දෙකක් (02) තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.*

## *අ කොටස - නීති ක්‍රම*

01. ශ්‍රී ලංකාවේ නීති මූලාශ්‍ර වශයෙන් ව්‍යවස්ථා, සාධාරණත්වය, ආගම සහ නීතිවේදීන්ගේ මත යන්නෙහි වැදගත්කම සාකච්ඡා කරන්න. (නීති මූලාශ්‍රයන්ගේ කරුණුවල සවිස්තරාත්මක පැහැදිලි කිරීමක් අපේක්ෂා නොකෙරේ.)

(ලකුණු 20)

02. කැලේගම ශ්‍රී ලංකාවේ දුෂ්කර ගම්මානයක් වන අතර එහි පදිංචිකරුවෝ වැඩි ප්‍රමාණයක් දුප්පත් ගොවීන් වෙති. පුංචිරාළ, මුදලිගේ හා බණ්ඩාර පවුල් පොහොසත් ඉඩම් හිමියන් වන අතර ගම්මානයේ බලවත්ම පුද්ගලයන් ද වේ. පරම්පරා ගණනක් තිස්සේ මෙම පවුල් විසින් කැලේගම ගම්මානයේ ගම්වැසියන් හා ඔවුන්ගේ දරුවන් තමන්ගේ නිවෙස්වල හා ඉඩම්වල විවිධාකාරයෙන් සේවයේ යොදවමින් සිටී.

90 වියැති ගම්වැසි කාන්තාවක වන සුදුමැණිකා, තමන් 7 වැනි වියේ සිට විවාහ වී වෙනම පදිංචි වන තෙක්ම බණ්ඩාර නිවසේ වැඩ කළ හැටි මතක් කරයි. ඇය පවසා සිටින්නේ තමා කුඩා කාලයේ දී තම මවද බණ්ඩාර කෙනෙකුට සේවය කර ඇති බවයි. සුදු මැණිකාගේ අවුරුදු 8 ක් වයසැති මිණිපිරිය වන රන්මැණිකා පුංචිරාළට සේවය කරයි.

1950 දී දරුවකු සේවයේ යොදවා ගැනීමේ අවම වයස අවුරුදු 14 ක් බවට පත් කරමින් නීතියක් සම්මත විය. කෙසේ වෙතත්, ඉහත සඳහන් පවුල් තුනම (පුංචිරාළ, මුදලිගේ, බණ්ඩාර පවුල්) ගම්මානයේ වයස අවු. 10 ට අඩු දරුවන් ඔවුන්ගේ සේවකයන් ලෙස තවදුරටත් සේවයේ යොදවමින් සිටී.

මෑතකදී රජයේ නිළධාරිනියක් කැලේගමට ගොස් මෙම ක්‍රියාකාරකම පිළිබඳ එම පවුල්වලින් ප්‍රශ්න කළේය. කෙසේවුවද එම පවුල් තර්ක කර සිටින්නේ ළමුන් සේවයේ යොදවා ගැනීම ගම්මානයේ වලංගු චාරිත්‍රයක් වන අතර එය ව්‍යවස්ථාපිතව තහනම් කිරීමෙන් පසුව ද දීර්ඝ කාලයක් තවදුරටත් ක්‍රියාත්මක වූ බවයි. ඔවුන් කියා සිටින්නේ ඔවුන් යටතේ සේවය කරන දරුවන් පාසල් නොයන නමුත් ගෘහාශ්‍රිත සේවය සඳහා පුහුණුව ලැබූවන් වන අතර, වයසින් මුහුකුරා ගිය විට පහසුවෙන් රැකියාවක් සොයාගත හැකි බවයි. තමන් යටතේ සේවය කරන ලද, මේ වන විට ගෘහ සේවිකාවන් ලෙස මැද පෙරදිග සේවය කරන කීප දෙනෙකුගේ නම් ඔවුන් විසින් පවසන ලදී.

කැලේගම පවතින මෙම චාරිත්‍රයේ වලංගුභාවය පිළිබඳව රජයේ නිලධාරිණිය ඔබගෙන් උපදෙස් අපේක්ෂා කරයි. ඇයට උපදෙස් දෙන්න.

(ලකුණු 20)

03. (අ) "ව්‍යවස්ථාදායකය අයුක්ති සහගත නොවිය යුතුය යන පූර්ව නිගමනය හේතුවෙන් ව්‍යවස්ථාවක් අතීතයට බලපාන අයුරින් ක්‍රියාත්මක වීමට එරෙහි වීමේ නම්‍යතාවයක් පවතී. පැහැදිලිවම අතීතයට බලපෑමේ චේතනාවක් පිළිබිඹු නොවුවහොත් එය ක්‍රියාත්මක වන්නේ ව්‍යවස්ථාව සම්මත කිරීමෙන් අනතුරුව උද්ගත වන සිද්ධීන් හෝ කරුණුවලට පමණි.

**Maxwell on the Interpretation of Statutes 12th Edition, p.215**

අදාළ නඩු නීති ඇසුරින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව විභාග කරන්න.

(ලකුණු 10)

(ආ) **"Generalia specialibus non degorant** යන්න සාමාන්‍ය ව්‍යවස්ථාවක් ඊට පෙර තිබූ විශේෂ නීතීන් සාර්ථක ලෙස අවලංගු කළ හැකි හෝ වෙනස් කළ හැකි බවට අර්ථ නිරූපනයේ දී පිළිගන්නා වූ පූර්ව නිගමනයකි."

ඔබ මේ ප්‍රකාශය සමඟ එකඟ වන්නේ ද ? අදාළ නඩු නීතියෙන් උදාහරණ දක්වමින් ඔබේ පිළිතුර විස්තර කරන්න.

(ලකුණු 10)

04. <u>පෙරේරා එ. සිල්වා</u> නඩුවේ **a, b, c, d** සහ **e** යන කරුණු අඩංගු වුවද, විනිසුරන් විසින් විෂය කරුණු ලෙස සලකා බැලුවේ **a, b,** හා **c** පමණි. 1968 දී උපරිමාධිකරණයේ විනිසුරන් දෙදෙනකු විසින් තීන්දුව ප්‍රකාශ කරන ලදී.

අධිකරණ පූර්ව නිදර්ශන න්‍යාය ඇසුරෙන් පහත අවස්ථා සාකච්ඡා කරන්න. ඔබේ පිළිතුරට පදනම පැහැදිලිව ඉදිරිපත් කිරීම ඔබගෙන් අපේක්ෂා කෙරේ.

(අ) 1970 රාජාධිකරණය **a,b,c** හා **d** යන විෂය කරුණු මත පදනම් වූ නඩුවක් තීරණය කිරීමේදී <u>පෙරේරා එ. සිල්වා</u> නඩුව අනුගමනය කිරීමට බැඳී තිබේද?

(ලකුණු 05)

(ආ) එක් විනිසුරුවරයකුගෙන් සමන්විත වූ 1973 අභියාචනාධිකරණයට **a, b** හා **c** කරුණු මත (සියළුම කරුණු විෂය කරුණු වේ.) පදනම් වන තීන්දුවක් දීමේ දී <u>පෙරේරා එ. සිල්වා</u> නඩුව අධිතීරණය කළ හැකි ද?

(ලකුණු 05)

(ඇ) නීතිඥ ප්‍රියන්ත මේ වන විට අභියාචනාධිකරණයේ විභාග වන **a, b, c** හා **f** යන කරුණු අඩංගු නඩුවක් වෙනුවෙන් පෙනී සිටී. මෙම නඩුව විනිසුරන් තිදෙනෙකු ඉදිරියේ විභාග වේ. ඉහත නඩු තීරණ තුනෙහිම පිටපත් ප්‍රියන්තට ලැබී ඇත. ( එනම් <u>පෙරේරා එ. සිල්වා</u> නඩු තීරණය සහ ප්‍රශ්න අංක 4 හි (අ) සහ (ආ) නඩුවලදී දුන් තීරණ.) එම නඩු තීරණ අතරින් කිනම් තීරණයක් අධිකරණ පූර්ව නිදර්ශන න්‍යාය යටතේ තමන්ට අදාළ කරගත හැකි දැයි ඔබෙන් උපදෙස් පතයි.

ප්‍රියන්තට උපදෙස් දෙන්න.

(ලකුණු 10)

## *ආ කොටස - රෝම නීතිය*

05. ධනවත් රෝම පවුලක වැඩිමහල් පිරිමි සාමාජිකයා සහ ප්‍රධානියා වන ක්ලෝඩියස් අන්තිම කැමති පත්‍රයක් ඇති කිරීමට අදහස් කරයි. ඔහුට ජූලියස්, කැස්කා සහ රොමියුලස් නමින් පුතුන් තිදෙනෙක් ද ක්ලියෝපැට්රා සහ පෝශියා යන නමින් දියණියන් දෙදෙනෙක් ද සිටී. ඔහු තම දේපළ ජූලියස්, කැස්කා සහ ඔහුගේ හොඳම මිතුරාගේ පුතා වන ප්ලූටෝ හට (ප්ලූටෝගේ පියා රෝමයේ දේශ ද්‍රෝහියකු ලෙස නම් කළ අතර ඔහු ප්ලූටෝ තනිකර රටින් පැනගොස් ඇත.) සමාන කොටස් ලැබෙන පරිදි අන්තිම කැමති පත්‍රය ලියයි. තවද, ඔහු ක්ලියෝපැට්රා හට රත්තරං මාලයක් ලැබෙන පරිදි සහ ඔහුගේ බිරිඳ වන වීනස් හට මරකත පෙන්ඩනයක් **(an emerald pendent)** සහ කරාබු කුට්ටමක් ලැබෙන පරිදි වගන්තීන් ඇතුළත් කරයි. තවද රෝම හමුදාවට සම්බන්ධ වී පිටරටක සටන් වැද සිටින රොමියුලස් යුද්ධයේ දී මිය යාවි යයි සහ නැවත නිවසට නොපැමිණේවි යයි යන බියෙන් ඔහුට දේපළ අහිමි කිරීමේ වගන්තියක් ද ඇතුළත් කරයි. පෝශියා අන්තිම කැමති පත්‍රයට ඇතුළත් නොවේ. ක්ලෝඩියස්ගේ අසල්වැසියන් වන රෝම වැසියන් දෙදෙනෙකු අන්තිම කැමති පත්‍රයට සාක්ෂිකරුවන් විය.

(අ) ක්ලෝඩියස් වලංගු අන්තිම කැමති පත්‍රයක් ඇති කර තිබේ ද? රෝම නීතියේ දේපළ අනුප්‍රාප්තිය ඇසුරෙන් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ආ) දේපළ බෙදීමේදී තමන්ට සාධාරණ ලෙස නොසලකන ලදැයි යන හැඟීමෙන් රොමියුලස්, පෝශියා සහ ක්ලියෝපැට්රා අන්තිම කැමති පත්‍රය අභියෝගයට ලක් කිරීමට තීරණය කරයි. ඔවුනට යම් ක්‍රියා මාර්ගයක් ගත හැකි නම් ඒ මොනවාදැයි සඳහන් කරන්න.

(ලකුණු 10)

06. "රෝම දිලික්ත නීතිය යම් යම් වැරදි ක්‍රියා තුළින් පැන නගින බැඳීම් සමග සම්බන්ධ වේ. පුළුල් සංකල්පයක් වූ එය 'වරදකරු' මත දඩුවම්, වන්දිගෙවීම් සහ පසුකාලීන නීතියේ දීර්ඝ කිරීම් මත ඇති වූ යථාර්ථ වගකීමද පවරයි."

ඔබ මෙම ප්‍රකාශ සමග එකඟ වන්නේ ද? දිලික්තමය සහ අර්ධ දිලික්තමය **(quasi delictual)** සංකල්පයන් ඇසුරින් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

(ලකුණු 20)

07. බෲටස් සහ ටයිටස් යාබද ඉඩම් දෙකක ඉදිකරන ලද නිවෙස්වල ජීවත් වේ. බෲටස් ජීවත්වන ඉඩමේ ජලය නොමැති අතර **in jure cessio** යටතේ ජලය ලබා ගැනීමේ අයිතිය බෲටස් ට ලබා දී ඇත. බෲටස්, කැෂියස්ට තමන්ගේ නිවස හා ඉඩම සම්බන්ධයෙන් ඵලප්‍රයෝජන අයිතිය ලබාදී, ඔහු අලුත් නිවසකට යයි.

පහත දැක්වෙන අවස්ථාවන් හා සම්බන්ධ නෛතික තත්ත්වය සාකච්ඡා කරන්න.

(අ) කැෂියස්ට තමාගේ ළිඳෙන් වතුර ලබා ගැනීමට ඉඩ දීම ටයිටස් ප්‍රතික්ෂේප කරයි.

(ආ) කැෂියස් එම නිවස රසකැවිලි වෙළඳසැලක් බවට පරිවර්තනය කරයි.

(ඇ) කැෂියස් ඇපල් ගස් කීපයකින් ඇපල් කඩා ජෑම් නිෂ්පාදනය කරයි. ඔහු එම ගස් කැෂියස්ගේ ඉඩමේ තිබෙන බවට විශ්වාස කළත් සත්‍ය ලෙසම ඒවා ඇත්තේ ටයිටස්ගේ ඉඩමේ ය.

(ඈ) බෘටස් සතුව කිකිළියන් කීප දෙනෙකු සිටින අතර උන් නිතරම යාබද ඉඩම්වල ඇවිදී. මේ බව දන්නා කැෂියස් තමන්ගේ ඉඩමට උන් පැමිණෙන තුරු බලා සිට උන්ව අල්ලා නැවත යා නොහැකි වන සේ කුඩු කරයි. කැෂියස් එම කිකිළියන්ට අයිතිය කියා පායි.

(ලකුණු 05 බැගින්)

08. පහත සඳහන් <u>දෙකක්</u> පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(අ) **'Patria Potestas'** සංකල්පය
(ආ) රෝම නීතියේ විවාහය
(ඇ) රෝම නීතියේ ඉතිහාසය කෙටියෙන්
(ඈ) **Contracts consensu**

(ලකුණු 10 බැගින්)

- හිමිකම් ඇවිරිණි. -